# ඓතිහාසික මුල්ගිරිගල රජමහා විහාරයේ බිතුසිතුවම් පිළිබඳව විමර්ශනාත්මක අධ්‍යයනයක්

එච්.පී.එන්.ඩී. ගලප්පත්ති

සමාජ විද්‍යා අධ්‍යයනාංශය, රුහුණු විශ්වවිද්‍යාලය
nipunidulsara98@gmail.com

**මුඛ්‍ය පද** - ඓතිහාසික, මුල්ගිරිගල, සිතුවම්, රජවරු, මහනුවර

## හැඳින්වීම

මුල්ගිරිගල විහාරස්ථානයේ වූ සිතුවම් මෙරට මහනුවර සිතුවම් සම්ප්‍රදායේ විශේෂ ස්ථානයක් හිමිකර ගනී. මෙහි වෙස්සන්තර, තේලපත්ත හා ශිවි වැනි ජාතක කතා තීරුගත ක්‍රමයට ද්විමාන සිතුවමින් නිරූපණය කොට තිබේ. මා විසින් සිදුකරන මෙම පර්යේෂණයේ ප්‍රධාන ගැටලුව වන්නේ ඓතිහාසික වශයෙන් වැදගත් වන මුල්ගිරි විහාරයේ සිතුවම්වල ඇති ඓතිහාසික වැදගත්කම හා වර්තමාන තත්ත්වය පිළිබඳව විමසා බැලීමයි. මුල්ගිරිගල විහාර සිතුවම්වල ස්වරූපය අනුව ඒවා එක් කාල සීමාවකට අයත් ඒවා නොවන බව පෙනේ. වැඩි ප්‍රමාණයක් මෑත යුගයට අයත් වන අතර සුළු ප්‍රමාණයක් මහනුවර යුගයට හා එම යුගයේ සම්ප්‍රදායට අයත් වේ. මුල්ගිරිගල රජමහා විහාරයේ සිතුවම් බොහොමයක් වර්තමානය වන විට විනාශ වී ඇති බව ද දක්නට ලැබේ. පහළ මළුවේ ලෙනෙහි සිතුවම් මහනුවර යුගයේ චිත්‍ර සම්ප්‍රදායට අයත් ඒවා බව පෙනේ. පදුම රහත් විහාර කුටියේ දක්නට ලැබෙන සිතුවම් අතර ග්‍රහචාරය දැක්වෙන සිතුවම්වලින් බිත්ති සරසා ඇති අතර ජාතක කතා, සත් සතිය, රහත් රූප හා දේව රූපවලින් අලංකාර කර ඇත. ඉතාමත් සියුම් ලෙස බිත්තිවල තීරු ඇඳ ඒවා කොටස්වලට බෙදා ඉතාමත් අලංකාර ලෙස සිතුවම් නිරූපණය කොට ඇත. බිත්තිවල ඇති ඉඩකඩ උපරිම ප්‍රයෝජනයට ගෙන ඇති බවක් පෙනේ. ජාතක කතා, සත්සතිය ආදිය මෙම කුටිවල චිත්‍ර අතර විශේෂ තැනක් ගනී. මෙහි ඇති පුරාවිද්‍යාත්මක වටිනාකම් සහිත ඓතිහාසික වශයෙන් වැදගත් සිතුවම්වල අර්ථය හා වැදගත්කම සෙවීම, එවක සමාජයේ මෝස්තර, විලාසිතා, වර්ණ ගැන්වීම පිළිබඳව අවබෝධයක් ලබා ගැනීම, එකල ජන සමාජය පිළිබඳව දළ අදහසක් ලබා ගැනීම මෙම පර්යේෂණයේ අරමුණ වශයෙන් පෙන්වා දිය හැකිය. මේ ආකාරයට මුල්ගිරිගල රජමහ විහාරය පිළිබඳවත් එහි සිතුවම් කලාව පිළිබඳවත් මූලික හඳුන්වාදීමක් සිදු කළ හැකිය.

## ක්‍රමවේදය

මෙම පර්යේෂණ පත්‍රිකා සැකසීමට තොරතුරු ලබාගැනීමේ දී විහාරාධිපති හිමි සහ ගම්වාසීන් කිහිප දෙනෙකුගෙන් තොරතුරු ලබා ගත් අතරම ඒ හරහා ද මුල්ගිරිගල සිතුවම් කලාව පිළිබඳ අවබෝධයක් ලබාගත හැකි විය. ප්‍රාථමික දත්ත රැස්කර ගන්නා ලද අතර ම ද්විතීයික දත්ත ලෙස ඓතිහාසික පොත් පත් ඇසුරෙන් තොරතුරු සම්පාදනයට අවස්ථාව උදාවිය. එහි දී සඟරා, ලිපි ලේඛන, සෙල්ලිපි හරහා සිදු කරන ලදී. දැනට ශේෂ වී ඇති ලෙන් හතේ චිත්‍ර පිළිබඳව දිසානායක මහතා මෙසේ පවසයි. මුල්ගිරිගල විහාරයේ කලාකරුවන් අතර ප්‍රසිද්ධියට පත් වූයේ එහි ඇති සිතුවම් නිසාය. ජාතක කතා, නවග්‍රහ මණ්ඩලය, රාක්ෂ රූප යනාදී නොයෙක් වර්ගයේ සිතුවම්වලින් මේ විහාර ගෙවල්වල බිත්ති අලංකාර වී ඇත. මේ ආකාරයට ඓතිහාසික මුල්ගිරිගල රජමහා විහාරයේ බිතු සිතුවම් පිළිබඳව විමර්ශනයක් ගුණාත්මකව ප්‍රාථමික හා ද්විතීයික දත්ත භාවිතයෙන් සිදු කිරීමට මෙහි දී අපේක්ෂා කෙරේ.

## ප්‍රතිඵල සහ සාකච්ඡාව

අනුරාධපුර යුගයේ මෙන් ස්වභාවික ලෙන් අවශ්‍ය පරිදි සකස් කර ගැනීමෙන් චිත්‍ර කර්මාන්තය කරන ලද ලෙන් විහාර නවයක් මෙම පර්වතයේ තැනින් තැන දක්නට ලැබෙතත් චිත්‍ර කර්මාන්ත ඇත්තේ ලෙන් හතක පමණි. ඉතිරි ලෙන් දෙකෙන් එකක චිත්‍ර

කර්මාන්ත තිබුණු බවට සලකුණු පෙනෙයි. එහෙත් ඒවා කිසිසේත්ම හඳුනාගත නොහැකි තරමට විනාශ වී ගොසිනි.

පර්වතය පාමුල සිට ඉහළ නගින්නෙකු ට ප්‍රථමයෙන් මුණගැසෙන්නේ ලෙන් විහාරය හෙවත් පදුම රහත් විහාරය නමින් හැඳින්වෙන ලෙන් විහාරයයි. මහනුවර යුගයට අයත් පැරණි චිත්‍ර රාශියක් මෙහි දක්නට ලැබෙයි. බිත්තියේ සිතුවම් කරනු ලැබූ දිව්‍ය රූප හයකි. වෙනත් ඒවා මේ මේ දෙවිවරුන් යයි නම්කර නැතත් හඳුනාගැනීමේ සලකුණු ඉතා පැහැදිලිව දක්වා තිබේ. ඒ අනුව මෙම දේව රූප විෂ්ණු, කතරගම, සූනියම් හා සමන් දෙවිවරුන්ගේ බව පැහැදිලි ය.

ප්‍රතිමාවලින් ආවරණය නොවූ බිත්තියේ ඉතිරි අවකාශය තිරස් අතට තීරු තුනකට බෙදා පළමුවන හා දෙවන තීරුවල ශ්‍රාවක රූප ද පහළ තීරුවේ මල් ලියකම් සහිත රමණීය මෝස්තරයන්ගෙන් ද සිතුවම් කර තිබේ. සිවිලිමේ සිත්තම් කර ඇත්තේ සූවිසි විවරණය යි. මෙම සිතුවම් පැරණි මුහුණුවරින් මෙන්ම හොඳ තත්ත්වයෙන් ආරක්ෂා වී ඇත. ජාතක කතා, සත්සතිය ආදිය මෙම ලෙන් කුටිවල චිත්‍ර අතර ප්‍රමුඛ තැනක් ගනී. බුද්ධ චරිතයේ නොයෙකුත් සිද්ධිවලට අදාළ දෑ මනා ලෙස සිතුවම් කොට ඇත. සත්ව රූප හා මිනිස් රූප චිත්‍රයට නැගීමේ දී ඒවා ස්වාභාවික ප්‍රමාණයෙන් නිරූපණය නොවේ. ළඟ සිටින මිනිසාට වඩා දුර සිටින මිනිසා විශාල ය. ඇතාට වඩා මිනිස්සු උසය. කතාවක් වැලක් සේ දිගට සිතුවම් කොට ඇත. එම කතාවන් හි සමහර කොටස් සමහර විටෙක ගසකින් හෝ ගොඩනැගිල්ලකින් වෙන්කොට ඇත. සත්සතිය නිරූපණය කිරීමේ දී වෙන වෙනම එක් එක් සතිය වෙනම දක්වා ඇත. මෙම චිත්‍ර පිළිබඳව තවදුරටත් විමසිලිමත් වීමේ දී එවකට තිබුණු මෝස්තර විලාසිතා ගැන ද අවබෝධයක් ලද හැකිය.

රජමහා නා ලෙන් විහාර කුටියේ චිත්‍ර ද මහනුවර යුගයේ චිත්‍ර සම්ප්‍රදායට ම අයත් බව පෙනේ. මෙහි දී පියස්ස උපයෝගී කොටගෙන එය කොටස්වලට බෙදා චිත්‍ර ඇඳ තිබේ. මේ ගෞතම බුදුන් වහන්සේ පෙරුම් පුරන සමයෙහි ඒ ඒ බුදුවරුන්ගෙන් විවරණ ගන්නා අයුරු එම බුදු රූ අසල දක්වා ඇති අතර නම් වශයෙන් ද සඳහන් කොට ඇත. ඒ හැර දේව රූප තුනක් ද යක්ෂ රූප එකක් ද වේ. ඉදිරිපස හා පසුපස රහත් රූප අටක් ද දක්නට ලැබේ.

මැද මළුවේ විහාර කුටිය ගත් විට එහි චිත්‍ර ඉතා මෑත යුගයට අයත් ඒවා වන අතර සිතුවම් කිරීමට තෙල් සායම් උපයෝගී කොට ගෙන ඇත. රජමහා විහාර කුටියේ පිටත මාලය ගත් විට මුල්ගිරිගල රජමහා විහාරයේ දක්නට ලැබෙන පැරණිම චිත්‍ර මෙහි ඇත. මිනිස් ශරීර සුදු, රෝස හා කලු කළු වර්ණයන්ගෙන් යුක්ත ය.

මුල්ගිරිගල විහාරයේ අවසාන වශයෙන් චිත්‍ර පිළිබඳව විමසා බලන විට පිරිනිවන් විහාර කුටිය පිළිබඳව ද අවධානය යොමු කළ හැකිය. ලෙන් පියස්ස සම්පූර්ණයෙන්ම බුද්ධ පරිනිර්වාණය සඳහා පැමිණි දේව බ්‍රහ්ම ආදීන්ගේ සිතුවම්වලට වෙන්කර ඇත. පසුබිම සම්පූර්ණයෙන්ම ආකාශය නිරූපණය කරයි.

ඉහත දැක් වූ පරිදි මුල්ගිරිගල රජමහා විහාරය තුළ පුරාවිද්‍යාත්මක වශයෙන් වටිනාකමක් ඇති චිත්‍ර රාශියක් දක්නට ඇති බවත්, එම සිතුවම් හරහා විරාගත ඓතිහාසික තොරතුරු මැනවින් අධ්‍යයනය කරන බව මෙහි දී නිගමනය කළ හැකි වේ.

**ආශ්‍රිත මූලාශ්‍රය**

සෝමතිලක. එම්. (2002). ***මහනුවර සම්ප්‍රදායේ බෞද්ධ සිතුවම් කලාව***, සිරි රංජන ප්‍රකාශන.

රත්නායක. දර්ශන. (2009). ***මහනුවර චිත්‍ර සම්ප්‍රදාය හා සමාජය.*** එල්ලක්කල: සුරම්‍ය ප්‍රකාශන.

මහින්ද හිමි. උණුවතුරබුබුලේ. (2007). ***දකුණේ විහරවල මහනුවර සම්ප්‍රදායේ චිත්‍ර***. ඇස් ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ.